# නාගානන්ද
# ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය



# ශිෂ්‍ය අත්පොත

## 2025 - 2026

## පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය

NIIBS, මානෙල්වත්ත, බොල්ලෑගල, කැලණිය.

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

## පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය

## *ශිෂ්‍ය අත්පොත*

## **2025/2026**

# ආයතනයේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

බුදුසමයේ උතුම් ආදර්ශමත් ලක්ෂණ මෙන්ම දාර්ශනික සහ ආචාරධර්මීය ඉගැන්වීම් ව්‍යාප්ත කිරීම මගින් සාමයෙන් සහ සමගියෙන් සපිරි ප්‍රබුද්ධ ලෝකයක් නිර්මාණය කරනු පිණිස අවශ්‍ය නායකත්වය ලබාදීම

## මෙහෙවර

කරුණාව සහ ප්‍රඥාව යන බෞද්ධ මූලධර්ම මත පදනම් වූ දැනුම අනාවරණය කරගැනීම, සුරැකීම සහ පතළකර හැරීම අපගේ මෙහෙවර වන්නේය. යාවජීව ඉගෙනුම, විචාරාත්මක චින්තනය සහ පුද්ගල සාර්ථකතා පෝෂණය කිරීමත් සෞඛ්‍යය, සංස්කෘතිය සහ සමාජ ශුභසාධනය යන ක්ෂේත්‍රයන්හි සකල මනුෂ්‍ය සංහතියෙහි හිත පිණිස ක්‍රියාත්මක වන මානව ව්‍යායාම තවදුරටත් දිරිමත් කරනු පිණිස ලොව පුරා වෙසෙන ප්‍රජාව සමග එක්ව ක්‍රියාකිරීමත් නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය විසින් සිදුකරනු ඇත.

# පටුන

ආයතනයේ දැක්ම හා මෙහෙවර

උපකුලපතීන්වහන්සේගේ පණිවුඩය

පීඨාධිපතිතුමාගේ පණිවිඩය

පාලක  මණ්ඩලීය සාමාජිකයින්

සනාතන සභා සාමාජිකයින්

පීඨ සභා සාමාජිකයින් (පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය)
ස්ථිර සහ ආරාධිත අධ්‍යයන කාර්ය මණ්ඩලය

පශ්චාත්උපාධි පීඨය මගින් පිරිනැමෙන උපාධි වැඩසටහන්

පශ්චාත්උපාධි වැඩසටහන්

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව


උසස් පර්යේෂණ උපාධි වැඩසටහන්

I. බෞද්ධ අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය

II. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය

පර්යේෂණාත්මක අධ්‍යයනයක් පදනම් කොටගෙන සිදුකෙරෙන නිබන්ධ සම්පාදනය සඳහා මාර්ගෝපදේශ

ආයතනයේ ගීතය



# උපකුලපතීන්වහන්සේගේ පණිවුඩය

අපගේ විශ්වවිද්‍යාලයයේ පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය වෙනුවෙන් මෙම පණිවුඩය නිකුත් කිරීමට අවස්ථාව ලැබීම මට ඉමහත් සතුටකි. මක්නිසාද යත් සෑම අධ්‍යයන කාර්යයක ම අවසාන ඵලය ලෝකයා වෙත ඉදිරිපත් කෙරෙනුයේ මෙම අධ්‍යයන පීඨය මගින් වන බැවිනි. දැනට දර්ශනපති සහ දර්ශන විශාරද පර්යේෂණ උපාධි වැඩසටහන් සඳහා විද්‍යාර්ථීන් 70 කට ආසන්න ප්‍රමාණයක් ලියාපදිංචිවී සිටින මෙම අධ්‍යයන පීඨයේ ප්‍රගතිය පිළිබඳව මම සම්පූර්ණයෙන් ම සෑහීමකට පත්වෙමි. ජාතික සහ ජාත්‍යන්තර මට්ටමෙන් අපගේ විශ්වවිද්‍යාලයයේ අභිමානය මෙම අධ්‍යයන පීඨය මගින් සිදුකෙරෙන පර්යේෂණවල ප්‍රතිඵල මගින් සනාථ කෙරෙනු ඇත. ජාතික සහ ජාත්‍යන්තර සන්දර්භය තුළ අසහාය පර්යේෂණ මධ්‍යස්ථානය බවට අපගේ පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය පත්වීම සඳහා විශ්වවිද්‍යාලයයේ අනෙකුත් සියලු ම පීඨ සහ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල ද දායකත්වය දෙනු ඇතැයි මම උදක් ම අපේක්ෂා කරමි.

පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම හිමි

උපකුලපති, නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

# පීඨාධිපතිතුමාගේ පණිවිඩය

ලොව සතර දිගට අයත් බුද්ධ ශ්‍රාවක භික්ෂු, භික්ෂුණී සහ උපාසක, උපාසිකා පිරිසගෙන් සමන්විත පශ්චාත්උපාධි අධ්‍යයනයෙහි යෙදෙන විද්වත් පිරිස නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ පශ්චාත් උපාධිඅධ්‍යන පීඨයෙහි හදවත වේ. කවරාකාර වූ හෝ සීමාවන්ගෙන් අවහිර නොවූ මෙම ආයතනයෙහි සියලු බෞද්ධ සම්ප්‍රදායන්ට අයත් ගිහි-පැවිදි විද්‍යාර්ථීන් පමණක් නොව වෙනත් ආගමික සම්ප්‍රදායනට අයත් විද්‍යාර්ථීහු ද අධ්‍යයනයෙහි නිරත වෙති.

අප පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය ප්‍රේරණය ලබනුයේ ''මාගේ ධර්මය විවෘතව පවත්නා කල්හි බබලයි; වසා තබා ඇති කල්හි නොබබලයි.'' යන දේශනා පාඨයෙනි. ධර්ම ගවේෂණයෙහි යෙදෙන සියලු දෙනාහට ද ස්වභාව ධර්මය ද ඇතුලු සකල ලෝක සත්වයා විෂයෙහි ධර්මය උපයෝගී කොට ගැනීම සඳහා ක්‍රම සහ විධි සොයන්නා වූ සියලු දෙනාහට ද නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය සමස්තයක් වශයෙනුත් අප පීඨය සුවිශේෂයෙනුත් ජාති ආගම් වැනි කිසිදු භේදයකින් තොරව විවෘතව පවතී.

නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ පශ්චාත්උපාධි පීඨයට ඔබ සාදරව පිළිගන්නා අතර, බුදුරජාණන්වහන්සේගේ ධර්මචක්‍රය අඛණ්ඩව ප්‍රවර්තනය කිරීමට වෑර දරන්නා වූ අප බෞද්ධ විද්වත් පර්ෂදය හා එක්වන ලෙස ඔබට ඉත සිතින් ආරාධනා කරනු කැමැත්තෙමි.

සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න

පීඨාධිපතිඃ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය

# පාලක මණ්ඩලීය සාමාජිකයින්

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි**
*උප කුලපති* *(සභාපති)*

**ජගත් සුමතිපාල මහතා** *(සාමාජික)*
*අධ්‍යක්ෂක*

**ඉංජිනේරු චමත් ද සිල්වා මහතා** *(සාමාජික)*
*ප්‍රධාන විධායක නිලධාරි*

**පූජ්‍ය ආචාර්ය දම්පේ විජිතරතන හිමි**
*නියෝජ්‍ය උපකුලපති/පීඨාධිපති-බෞද්ධ අධ්‍යයන පීඨය* *(සාමාජික)*

**පියරත්න රණසිංහ ආරච්චි මහතා** *(ලේකම්)*
*ලේඛකාධිකාරී*

**සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න මහතා** *(සාමාජික)*

*පීඨාධිපති-පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය*

**මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා** *(සාමාජික)*
*පීඨාධිපති- මානව ශාස්ත්‍ර පීඨය*

**මහාචාර්ය ආර්. වේරවත්ත** *(සාමාජික)*
*අධ්‍යක්ෂ-තොරතුරු තාක්ෂණ පාසල*

**මහාචාර්ය වසන්ත ප්‍රියදර්ශන මහතා** *(සාමාජික)*
*අධ්‍යයන උපදේශක*

**පූජ්‍ය පස්ගොඩ සුමිත්ත හිමි** *(සාමාජික)*
*නම්කරන ලද පීඨ සාමාජික*

**පූජ්‍ය සූරියවැව සුමේධ හිමි** *(සාමාජික)*
*නම්කරන ලද පීඨ සාමාජික*

**නිමලසිරි ගාල්ලගේ මහතා** *(සාමාජික)*
*මූල්‍යාධිකාරී*

## සනාතන සභා සාමාජිකයින්

**පූජ්‍ය ආචාර්ය බෝදාගම චන්දිම නාහිමි**

*උප කුලපති* *(සභාපති)*

**පූජ්‍ය ආචාර්ය දම්පේ විජිතරතන හිමි**

*නියෝජ්‍ය උපකුලපති/පීඨාධිපති-බෞද්ධ අධ්‍යයන පීඨය* *(සාමාජික)*

**ඉංජිනේරු චමත් ද සිල්වා මහතා** *(සාමාජික)*

*ප්‍රධාන විධායක නිලධාරි*

**පියරත්න රණසිංහ ආරච්චි මහතා** *(ලේකම්)*

*ලේඛකාධිකාරී*

**සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න මහතා** *(සාමාජික)*

*පීඨාධිපති-පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය*

**මහාචාර්ය පී.බී. මණ්ඩාවල මහතා** *(සාමාජික)*

*පීඨාධිපති- මානව ශාස්ත්‍ර පීඨය*

**මහාචාර්ය වසන්ත ප්‍රියදර්ශන මහතා** *(සාමාජික)*

*අධ්‍යයන උපදේශක-බෞද්ධ අධ්‍යයන පීඨය*

*පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත්උපාධි ආයතනය*

*(කැලණිය විශ්වවිද්‍යාලය), කැලණිය*

**මහාචාර්ය ආර්. වේරවත්ත** *(සාමාජික)*

*අධ්‍යක්ෂ-තොරතුරු තාක්ෂණ පාසල*

**පූජ්‍ය මහාචාර්ය ඉත්තෑදෙමලියේ ඉන්ද්‍රසාර හිමි** *(පත්කළ සාමාජික)*

*හිටපු උපකුලපති, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම*

**පූජ්‍ය මහාචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි** *(පත්කළ සාමාජික)*

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල*

**ආචාර්ය හසන්ත හෙට්ටිආරච්චි මහතා** *(පත්කළ සාමාජික)*

**මහාචාර්ය රංජිත් දිසානායක මහතා** *(පත්කළ සාමාජික)*

*සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය*

**ඩබ්ලිව්. ඩී. සේනක සෙනෙවිරත්න මහතා** *(සාමාජික)*
*අධ්‍යක්ෂ-CIQA*

**ආචාර්ය කේ. මදනායක මහත්මිය** *(සාමාජික)*
*අංශාධිපති-ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය*

**සුනෙත් බණ්ඩාර මහතා** *(සාමාජික)*
*අංශාධිපති-පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය*

**පූජ්‍ය පස්ගොඩ සුමිත්ත හිමි** *(සාමාජික)*
*අංශාධිපති-භාෂා අධ්‍යයනාංශය*

**පූජ්‍ය සූරියවැව සුමේධ හිමි** *(සාමාජික)*
*නම්කරන ලද සාමාජික -බෞද්ධ අධ්‍යයනාංශය*

**පූජ්‍ය ගුරුගොඩ සිරිවිමල හිමි** *(සාමාජික)*
*සහකාර ලේඛකාධිකාරී-අධ්‍යයන සහ විභාග*

**ඉෂාණි උදේශිකා මෙනෙවිය** *(සාමාජික)*

*සහකාර පුස්තකාලයාධිපති*

# පීඨ සභා සාමාජිකයින්

## පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය

**සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න මහතා** *(සභාපති)*
*පීඨාධිපති, පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය*

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය උදිත ගරුසිංහ මහතා** *සාමාජික (බාහිර)*

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.*

**පූජ්‍ය මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි** *සාමාජික (බාහිර)*

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල*

**පූජ්‍ය ආචාර්ය දම්පේ විජිතරතන හිමි** *(සාමාජික)*
*පීඨාධිපති -බෞද්ධ අධ්‍යයන පීඨය*

**මහාචාර්ය පි. බී. මණ්ඩාවල** *(සාමාජික)*
*පීඨාධිපති, මානව ශාස්ත්‍ර පීඨය*

**මහාචාර්ය ආර්. වේරවත්ත** *(සාමාජික)*
*අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ පාසැල*

**ආචාර්ය කුමාරි මදනායක මහත්මිය** *(සාමාජික)*
*අංශාධිපති , ප්‍රායෝගික බෞද්ධ අධ්‍යයනාංශය*

**සුනෙත් බණ්ඩාර මහතා** *(සාමාජික)*
*අංශාධිපති, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය*

**ආචාර්ය ඩී. ඩී. සේනාධීර මහතා** *(සාමාජික)*
*විද්‍යාත්මක සහකාර*

**ගයනි කුමානායක මෙනවිය** *(ලේකම්)*
*සහකාර ලේඛකාධිකාරී*

## ස්ථිර සහ ආරාධිත අධ්‍යයන කාර්ය මණ්ඩලය

**සේවාර්ජිත මහාචාර්ය අසංග තිලකරත්න මහතා**

*එම්. ඒ, පී.එච්. ඩී (හවායි)*

**පූජ්‍ය ආචාර්ය දම්පේ විජිතරතන හිමි**

*එම්. ඒ, පී.එච්. ඩී.*

**මහාචාර්ය අනුර මනතුංග මහතා**

*පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය*

**මහාචාර්ය ගාමණී රත්නශ්‍රී මහතා**

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල*

**ආචාර්ය ඩී. ඩී. සේනාධීර මහතා**

*බී. ඒ. (විශේෂ), පී.එච්. ඩී.*

**ආචාර්ය හසන්ත සමරසිංහ මහතා**

*බී. ඒ. (විශේෂ), පී.එච්. ඩී.*

**ආචාර්ය දිල්ශාන් මනෝජ් මහතා**

*එම්. ඒ, පී.එච්. ඩී.*

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර*

**ආචාර්ය කුමාරි මදනායක මහත්මිය**

*බී. ඒ. (විශේෂ), එම්.ඒ. , පී.එච්.ඩී.*

**සුනෙත් බණ්ඩාර මහතා**

*බී. ඒ. (විශේෂ), එම්. ඒ.*

**ආචාර්ය කේ. ඉන්ද්‍රා චන්ද්‍රමාලි මහත්මිය (පාඨමාලා සමායෝජක)**

*බී. ඒ., එම්. ඒ, පී.එච්. ඩී.*

**විද්‍යාත්මක සහකාර**

**ආචාර්ය ඩී. ඩී. සේනාධීර මහතා**

**<u>පරිපාලන කාර්ය මණ්ඩලය</u>**

**ගයනි කුමානායක මෙනවිය**

*සහකාර ලේඛකාධිකාරී*

**<u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>**

**ආර්. වී. වී. අයේෂා ලක්මාලි මහත්මිය**

කළමනාකරණ සහකාර

# පශ්චාත්උපාධි පීඨය මගින් පිරිනැමෙන උපාධි වැඩසටහන්

නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ පශ්චාත්උපාධි පීඨය මගින් පහත දැක්වෙන පශ්චාත්උපාධි පාඨමාලා සහ පර්යේෂණ උපාධි වැඩසටහන් මෙහෙයවීම සිදුකරනු ලැබේ.

1. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
2. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව
3. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය
4. බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය

**අයැදුම්කිරීමේ ක්‍රියාදාමය (පොදු)**

ඉහත සඳහන් උපාධි පාඨමාලාවලට සහ වැඩසටහන්වලට ඇතුලත්වීමට බලාපොරොත්තුවන අපේක්ෂකයින් ඒ සඳහා නිර්දේශිත ආකෘතිපත්‍රයක නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයැදුම්පත්‍රයක් නියමිත දිනට පෙර පශ්චාත්උපාධි අධ්‍යයන පීඨයේ සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළයුතුය. කෙසේවෙතත් බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති සහ දර්ශන විශාරද පර්යේෂණ උපාධි වැඩසටහන් සඳහා වර්ෂයේ කවර දිනයකදී වුව ද අයැදුම්පත් ඉදිරිපත් කළහැකිය.

සෑම අයැදුම්කරුවෙක් ම සිය සුදුසුකම් සනාථ කරනු පිණිස මුල් සහතිකවල සහතික කරන ලද පිටපත් සහ වෙනත් අදාළ ලියකියවිලි අයැදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.

පීඨ සභාවේ මෙන්ම සනාතන සභාවේ ද අනුමැතිය ලැබීමෙන් අනතුරුව ආයතනයේ සියලුම නීතිරීති සහ රෙගුලාසි අපේක්ෂකයා/අපේක්ෂිකාව විසින් අනුගමනය කරනු ලැබීමට යටත්ව ඔහු/ඇය අදාළ පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලැබේ. මුල්වරට ලියාපදිංචි වූ දින සිට අදාළ පාඨමාලාවේ අවශ්‍යතා සම්පූර්ණ කරන තෙක් සිය ලියාපදිංචිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වගබලාගැනීම සෑම ශිෂ්‍යයෙකුගේ ම වගකීම වන්නේය.

ලියාපදිංචිවීමට හෝ සිය ලියාපදිංචිය නියමිත දිනට පෙර අලුත්කර ගැනීමට හෝ අපොහොසත්වන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් සිය කැමැත්තෙන්ම උපාධි වැඩසටහනෙන් ඉවත්වූ පුද්ගලයින් ලෙස සළකනු ලැබේ.

පහත සඳහන් හේතු මත (සනාතන සභාවේ එකඟත්වය ද සහිතව) අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය අවලංගුකිරීමට පීඨ සභාවට බලය ඇත.

අ. අයදුම්පතෙහි අයදුම්කරු විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව හෙළිවීම

ආ. අධ්‍යයනය සඳහා නියමිත උපරිම කාලපරිච්ඡේදය ඉක්මවා යාම

ඇ. නියමිත දිනට පෙර ලියාදිංචි ගාස්තු/වැඩසටහන් ගාස්තු නොගෙවීම

ඇ. ප්‍රගති වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම

ඉ. අධ්‍යයන ප්‍රගතිය අසතුටුදායක වීම

ඊ. නාගානන්ද ජාත්‍යන්තර අධ්‍යයන ආයතනයේ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම

# පශ්චාත්උපාධි වැඩසටහන්

මෙම පීඨය මගින් පහත දැක්වෙන පශ්චාත්උපාධි පාඨමාලා සහ උසස් පර්යේෂණ උපාධි වැඩසටහන් මෙහෙයවීම  සඳහා පහසුකම් සැළසීම සිදුකරනු ලැබේ.

**පාඨමාලානුගත පශ්චාත්උපාධි පාඨමාලා**

- බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාත්උපාධි පාඨමාලාව
- බෞද්ධ අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රපතිඋපාධි පාඨමාලාව

**උසස් පර්යේෂණ උපාධි වැඩසටහන්**

- බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධිය
- බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය

## බඳවාගැනීම

මෙම පීඨය මගින් මෙහෙයවනු ලබන පාඨමාලා සඳහා බඳවා ගැනීමට සළකා බැලෙනුයේ ඒ සඳහා නිදේශිත සියලු ම සුදුසුකම් සම්පූර්ණ කොට ඇති අපේක්ෂකයින් පමණි. ඒ අනුව පශ්චාත්උපාධි පාඨමාලාවක් හෝ පර්යේෂණාත්මක අධ්‍යයන වැඩසටහනක් හෝ සඳහා ඇතුලත්වීමට අපේක්ෂා කරන අයදුම්කරුවකු ඒ සඳහා ආයතනයේ කාර්යාලයෙන් ලබාගත් ආකෘතිපත්‍රයක් යථාපරිදි සම්පූර්ණ කොට ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළයුතුය.

ඇතුලත්වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පතක් පිළිබඳව ම  පීඨසභාව විසින් සළකා බලා තීරණයක් ගනුලැබේ.

## ලියාපදිංචි කිරීම

පීඨසභාව විසින් කිසියම් අයදුම්කරුවකුගේ අයදුම්පතක් පිළිගත් පසු අපේක්ෂිත පාඨමාලාවට අදාළ සියලුම නීති සහ රෙගුලාසි අනුගමනය කිරීමට යටත්ව ඔහු/ඇය එම පාඨමාලාව සඳහා ලියාපදිංචි කරනු ලැබේ.

මුල්වරට ලියාපදිංචිවූ දින සිට අදාළ පාඨමාලාවේ අවශ්‍යතා සම්පූර්ණ කරන තෙක් සිය ලියාපදිංචිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වගබලාගැනීම සෑම ශිෂ්‍යයෙකුගේ ම වගකීම වන්නේය. සිය ලියාපදිංචිය නියමිත දිනට අලුත්කර ගැනීමට අපොහොසත් වන අපේක්ෂකයින් සිය කැමැත්තෙන් ම උපාධි වැඩසටහනෙන් ඉවත්වූ පුද්ගලයින් ලෙස සළකනු ලැබේ.

පහත සඳහන් හේතු මත (සනාතන සභාවේ එකඟත්වය ද සහිතව) අපේක්ෂකයෙකුගේ ලියාපදිංචිය අවලංගුකිරීමට පීඨ සභාවට බලය ඇත.

අ. අයදුම්පතෙහි අයදුම්කරු විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව හෙළිවීම

ආ. අධ්‍යයනය සඳහා නියමිත උපරිම කාලපරිච්ඡේදය ඉක්මවා යාම

ඇ. නියමිත දිනට පෙර ලියාදිංචි ගාස්තු/වැඩසටහන් ගාස්තු නොගෙවීම

ඈ. ප්‍රගති වාර්තා නියමිත වේලාවට ඉදිරිපත් නොකිරීම

ඉ. අධ්‍යයන ප්‍රගතිය අසතුටුදායක වීම

ඊ. නාගානන්ද ජාත්‍යන්තර අධ්‍යයන ආයතනයේ නීති සහ රෙගුලාසි උල්ලංඝනය කිරීම

පර්යේෂණ උපාධියක් සඳහා ලියාපදිංචිවී සිටින ශිෂ්‍යයෙකු සිය පර්යේෂණ නිබන්ධයෙහි මාතෘකාව සම්බන්ධයෙන් හෝ අදාළ වෙනත් කිසියම් කරුණක් සම්බන්ධයෙන් හෝ යම් සංශෝධනයක් අපේක්ෂා කරන්නේ නම් සිය ලියාපදිංචිය අවසානවීමට මාස 03 කට පෙර ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් පීඨාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතුය. පීඨාධිපතිවරයා විසින් එම ඉල්ලීම සළකා බලා තීරණයක් ගැනීම පිණිස පීඨසභාව වෙත ඉදිරිපත් කරනු ඇත.

**භාෂා මාධ්‍ය**

සියලු ම පාඨමාලානුගත අධ්‍යයන සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන් ම සිදුකෙරේ. ශිෂ්‍යයාගේ අභිමතය පරිදි තෝරාගත් මාධ්‍යය අයදුම්පතෙහි නිශ්චිතව සඳහන් කළ යුතුය.

ගාස්තු

ලියාපදිංචිකිරීමේ ගාස්තු, පශ්චාත්උපාධි පාඨමාලා සහ උසස් උපාධි පර්යේෂණ වැඩසටහන් සඳහා ගෙවිය යුතු ගාස්තු සහ විභාග ගාස්තු ආයතනයේ අධිකාරීන් විසින් තීරණය කරනු ලබන අතර ඔවුන් විසින් පනවනු ලබන නියමයන්ට අනුකූලව ඒවා ගෙවීම සිදුකළ යුතුය.

**පරීක්ෂණ**

පශ්චාත්උපාධි පාඨමාලා සඳහා හෝ පර්යේෂණ වැඩසටහන් සඳහා හෝ විධිමත් පරිදි ලියාපදිංචිවී ආයතනය විසින් නියම කරනු ලබන අවශ්‍යතා සපුරා ඇති විද්‍යාර්ථීන්ට එම පාඨමාලා සහ වැඩසටහන්වලට අදාළ පරීක්ෂණවලට පෙනීසිටීම සඳහා අයදුම් කළහැකිය.

ආයතනය විසින් නිකුත්කරනු ලබන පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන් සිදුකෙරෙන කිසිදු විමසීමක් හෝ අභියාචනයක් ආයතනය විසින් භාරගනු නොලැබේ.

**සහතිකපත්‍ර සහ උපාධි ප්‍රදානය**

පශ්චාත්උපාධි පාඨමාලාවන්ට අදාළ පරීක්ෂණයකින් හෝ උසස් උපාධි පර්යේෂණ වැඩසටහනකින් සාමාර්ථ්‍යය ලත් විද්‍යාර්ථියෙකුට සිය සාමාර්ථ්‍යය සහතික කෙරෙන ප්‍රකාශනයක් ඒ සඳහා නියමිත ගාස්තු ගෙවීමෙන් අනතුරුව ලබාගත හැකිය.

කුලපතිතුමා විසින් නියම කරනු ලබන දිනයක සහ වේලාවක නියමිත ස්ථානයකදී ආයතනය විසින් උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන අතර අදාළ අවශ්‍යතා සපුරා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උසස් උපාධි ලාභීන් ඒ සඳහා යථාපරිදි අයදුම් කළයුතුවේ.

## නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

## පශ්චාත්උපාධි පීඨය

## බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත්උපාධි ඩිප්ලෝමා පාඨමාලාව

## විෂය නිර්දේශය

**පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා අරමුණු**

මෙම පාඨමාලාවෙහි අරමුණු දෙකකි. පිළිගත් විශ්වද්‍යාලයකින් හෝ පිළිගත් උසස් අධ්‍යයන ආයතනයකින් කවර හෝ අධ්‍යයන පාඨමාලාවක් හදාරා දැනටමත් ප්‍රථම උපාධියක් ලබා ඇති විද්‍යාර්ථීන්ට

(i) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති සහ දර්ශන විශාරද වැනි උසස් පර්යේෂණ උපාධි සඳහා යොමුවූ බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයට ප්‍රවේශ වනු පිණිස අවකාශයක් නිර්මාණය කිරීම

(ii) බුදුසමය පිළිබඳ සවිමත් මූලික දැනුමක් ලබාගැනීමට කැමති විවිධ ක්ෂේත්‍රවලට අයත් විද්වත් වෘත්තිකයින් ඇතුලු පුද්ගලයින්ට බුදුසමය පිළිබඳ විශ්වාසනීය සහ විද්‍යාත්මක හැඳින්වීමක් ලබාදීම

මෙම ක්ෂේත්‍රය තුළ ශාස්ත්‍රීය සහ වෘත්තිමය වශයෙන් සුදුසුකම් ලත් විද්වතුන් විසින් මෙම පාඨමාලාව සඳහා දේශන පවත්වනු ලැබේ.

**ප්‍රවේශය සඳහා සුදුසුකම්:**

මෙම පාඨමාලාවට ප්‍රවේශවීමට බලාපොරොත්තුවන අපේක්ෂකයින් පහත සඳහන් සුදුසුකම් අතරින් එකක් හෝ සපුරා තිබිය යුතුය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් උපාධියක් ලබාතිබීම

හෝ

ii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ අවසාන පරීක්ෂණයෙන් සමත්ව තිබීම

හෝ

iii. ඉහත සඳහන් සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨ සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබාතිබීම

**PGDBS 1115 ඃ බුදුසමයේ පසුබිම සහ ප්‍රභවය**

**PGDBS 1125ඃ බුදුසමයේ මූලික ඉගැන්වීම්**

**PGDBS 1135: බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**

**PGDBS 1245: බෞද්ධ සම්ප්‍රදාය සහ බෞද්ධ ලෝකය**

**PGDBS 1255: බුදුසමයේ නූතන අදාළත්වය**

**පාඨමාලාව සඳහා අවශ්‍යතා:** එක් එක් ඒකකයට අයත් පැවරුමක් ද සහිතව විද්‍යාර්ථීන් විසින් යථෝක්ත පාඨමාලා ඒකක පහ සම්පූර්ණකිරීම අවශ්‍යය.

මෙම පාඨමාලාව එක් ඒකකයක් දේශන පැය 30 කින් යුතු ඉහත දැක්වෙන පාඨමාලා ඒකක පහෙන් සමන්විත වේ.

**ඇගයීම් ක්‍රමය:**

| | |
|---|---|
| i. එක් පාඨමාලා ඒකකයකට අයත් පැවරුම සඳහා වන ලකුණු සංඛ්‍යාව | 30% |
| ii. පන්තිකාමර සහභාගීත්වය | 10% |
| iii. අවසාන පරීක්ෂණය | 60% |

## විෂය නිර්දේශය

(1) **පාඨමාලා ඒකක නාමය: බුදුසමයේ පසුබිම සහ ප්‍රභවය**

**පාඨමාලා ඒකක සංකේතය : PGDBS 1115**

**අරමුණ:** ක්‍රිස්තු පූර්ව හයවැනි ශතවර්ෂය තුළ ඉන්දියාවේ බුදුසමයේ සමාජ පසුබිම සහ බුදුන්වහන්සේ, උන්වහන්සේගේ ජීවිතය සහ උන්වහන්සේගේ මෙහෙවර පිළිබඳව දැනුමක් විද්‍යාර්ථීයාට ලබාදීම සඳහා මෙම පාඨමාලා ඒකකය සැළසුම් කර ඇත.

**අන්තර්ගතය:** මෙම පාඨමාලා ඒකකය පහත සඳහන් කරුණු ආවරණය කරයි: ප්‍රාග් බෞද්ධ ඉන්දීය සමාජය, බුදුරදුන්ට සමකාලීන සමාජය හා එහි සමාජයීය දේශපාලන ආර්ථික හා ආගමික තත්ව, බුද්ධත්වය, බුදුරදුන්ගේ ජීවිතය සහ මෙහෙවර, ත්‍රිවිධරත්නය සහ බුදුසසුනේ ආරම්භය.

**කාලසීමාව** : දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** : දේශන, සාකච්ඡා වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** : අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව, බුදුසමයේ සමාජ හා ආගමික පසුබිම ද බුදුරදුන් පිළිබඳ සංකල්පය හා දිව්‍යමය මැදිහත්වීමක් රහිත විමුක්තිමාර්ගයක් පෙන්වාදීමේ උන්වහන්සේගේ මෙහෙවර ද පිළිබඳ දැනුමක් විද්‍යාර්ථීයාගෙන් අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්:**

ඩේවිඩ්ස්, රීස්, *බෞද්ධ භාරතය,* අනුවාදක, උදම්මිට ධම්මජෝති හිමි, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2009.

කලුපහන, ඩී. ජේ. , *භාරතීය දර්ශන ඉතිහාසය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1961.

රාධාක්‍රිෂ්ණන්, එස්., *ඉන්දීය දර්ශනය.* කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1970.

Basham, L., *A Cultural History of India*, Oxford: Oxford University Press, 1975.

(2) **පාඨමාලා ඒකක නාමය: බුදුසමයේ මූලික ඉගැන්වීම්**

**පාඨමාලා ඒකක සංකේතය : PGDBS 1125**

**අරමුණ:** බුදුරදුන්ගේ මූලික ඉගැන්වීම් පිළිබඳව සවිමත් සහ විශ්වාසනීය දැනුමක් විද්‍යාර්ථීයාට ලබාදෙනු පිණිස මෙම පාඨමාලා ඒකකය සැළසුම් කොට ඇත.

**අන්තර්ගතය:** මෙම පාඨමාලා ඒකකය පහත සඳහන් කරුණු ආවරණය කරයි: පාලි මූලාශ්‍රය පිළිබඳ හැඳින්වීමක්, පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය, යථාර්ථය පිළිබඳ ත්‍රිලක්ෂණය, බෝධ්‍යංග සහ සීල සමාධි සහ පඤ්ඤා ඇතුලත් ප්‍රතිපදාව සහ සමාජ උපයුක්ත ඉගැන්වීම්

**කාලසීමාව** : දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** : දේශන සාකච්ඡා වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** : අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව බුදුසමයේ මූලික ඉගැන්වීම් විස්තරාත්මකව පැහැදිලි කිරීමටත් සංගතවූ සමස්තයක් නිර්මාණය වන එම ඉගැන්වීම්වල ඒකාබද්ධතාව දැකීමටත් විද්‍යාර්ථීයා සමත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්:**

රාහුල හිමි, වල්පොල , *බුදුන් වදාළ ධර්මය,* කොළඹ: සීමාසහිත එම්. ඩි. ගුණසෝන සහ සමාගම, 1993.

විජේබණ්ඩාර, චන්දිම හා එච්. එම්. මොරටුවගම, *ආදි බෞද්ධ චින්තනය. අදහස් කීපයක්.* කොළඹ: ගොඩගේ සහ සහෝදරයෝ, 1995.

අරියවිමල හිමි, කොස්වත්තේ, *බුද්ධ ධර්මය,* මරදාන: සමයවර්ධන මුද්‍රණශිල්පියෝ (පෞද්ගලික) සමාගම.

තෝමස්, ඊ. ජේ., බෞද්ධ චින්තාවේ ඉතිහාසය, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම, 1966.

Kalupahana, D. J., *Buddhist Philosophy: A Historical Analysis.* Honolulu: University Press of Hawaii. 1976.

(3) **පාඨමාලා ඒකක නාමයඃ බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**

**පාඨමාලා ඒකක සංකේතය ඃ PGDBS 1135**

**අරමුණඃ** ආසියාව හරහා සිදුවූ බුදුසමයේ ඓතිහාසික පරිණාමය පිළිබඳව සහ මූලික වශයෙන් බුදුසමයෙහි ප්‍රභාව ලබමින් මෙම ප්‍රදේශවල සිදුවූ සංස්කෘතික පරිණාමය පිළිබඳව සාමාන්‍ය අවබෝධයක් විද්‍යාර්ථියාට ලබාදීමේ අපේක්ෂාවෙන් මෙම පාඨමාලා ඒකකය සැළසුම් කර ඇත.

**අන්තර්ගතයඃ** මෙම පාඨමාලා ඒකකය පහත සඳහන් කරුණු ආවරණය කරයිඃ සම්බුද්ධ පරිනිර්වාණයේ සිට ඉන්දියාව තුළ බුදුසමයේ ඉතිහාසය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව තුළත් අග්නිදිග ආසියාව සහ නැගෙනහිර ආසියාව තුළත් බුදුසමයේ පැතිරීම සහ බුදුසමයේ ආභාෂය යටතේ මෙම රටවල සිදුවූ සංස්කෘතික උරුමයේ පරිණාමය.

**කාලසීමාව** ඃ දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** ඃ දේශන, සාකච්ඡා වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** ඃ අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල ඃ** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව පුරාණ ආසියාව හරහා සිදුවූ බුදුසමයේ ඓතිහාසික ගමන්මග විස්තර කිරීමට සහ බුදුසමය පැතිරීගිය රටවල සංස්කෘතික සංවර්ධනයේ ස්වරූපය අගය කිරීමට විද්‍යාර්ථියා සමත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්ඃ**


අදිකාරම්, ඊ. ඩබ්. *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධයස්ථානය.

ආරියරත්න, සුනිල්, *දෙමළ බෞද්ධයා*, කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ 2008.

ඉලංගසිංහ, මංගල, *ආසියාවේ බෞද්ධ ඉතිහාසය* (පළමුවන කොටස), කඩවතඃ අභය මුද්‍රණ ශිල්පියෝ' 1997.

පඤ්ඤාලෝක හිමි, වැයිහේනේ, *වෛදික යුගයෙන් බෞද්ධ යුගයට*, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2012.

Dutt, Sukumar, *Buddha in East Asia*, Delhi: Originals, Nimri Commercial Centre.


(4) **පාඨමාලා ඒකක නාමයඃ බෞද්ධ සම්ප්‍රදාය සහ බෞද්ධ ලෝකය**

**පාඨමාලා ඒකක සංකේතය ඃ PGDBS 1245**

**අරමුණ** : ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදාය තුනෙහි මූලික කරුණු සහ එම සම්ප්‍රදායවල ගෝලීය පැතිරීම පිළිබඳ දැනුමක් විද්‍යාර්ථියාට ලබාදීම අරමුණු කොටගෙන මෙම පාඨමාලා ඒකකය සැළසුම් කොට ඇත.

**අන්තර්ගතය:** මෙම පාඨමාලා ඒකකය පහත සඳහන් කරුණු ආවරණය කරයි: ථෙරවාදය, මහායානය සහ වජ්‍රයානය, ඒවාට ම ආවේණික වූ ඉගැන්වීම් සහ ප්‍රතිපදා, එම නිකායන්ගේ පැතිරීම විශේෂයෙන් අතීතයේ දී සහ වර්තමානයේදී මහායානයේ සහ වජ්‍රයානයේ පැතිරීම, වර්තමානයේ දී බුදුසමයේ ගෝලීය තත්වය.

**කාලසීමාව** : දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** : දේශන සාකච්ඡා වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** : අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල :** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායන්ගේ ධර්මමය සහ සංස්කෘතික පැතිකඩ හඳුනාගැනීමටත් බුදුසමයේ වර්තමාන ගෝලීය පැවැත්ම සම්බන්ධයෙන් දැනුමක් ඇතිකරගැනීමටත් විද්‍යාර්ථියා සමත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්:**


උපාධ්‍යාය, බලදේව, *භාරතීය දර්ශන*, පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2009.

මේධානන්ද හිමි, දේවාලේගම, *චතුර්විධ බෞද්ධ සම්ප්‍රදාය හැඳින්වීමක්*, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, 1992.

Abenayaka, Oliver & Asanga Tilakaratne, *2600 Years of Sambuddhatva: Journey of Awakening*, Colombo: Ministry of Buddha Sasana, Government of Sri Lanka, 2012.


**(5) පාඨමාලා ඒකක නාමය: බුදුසමයේ නූතන අදාළත්වය**

**පාඨමාලා ඒකක සංකේතය: PGDBS 1255**

**අරමුණ:** සමකාලීන ලෝකයේ සංකීර්ණ අභියෝගවලට මුහුණදීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල සහ ප්‍රතිපදාවල භාවිතය පිළිබඳ අවබෝධයක් විද්‍යාර්ථියාට ලබාදීම පිණිස මෙම පාඨමාලා ඒකකය සැළසුම් කරඇත.

**අන්තර්ගතය:** (i) සමකාලීන ලෝකයේ අභියෝග: ගෝලීකරණය සහ එහි අභියෝග; (ii) පුද්ගල සහ මනෝවිද්‍යාත්මක ගැටලු නිරාකරණය සඳහා බුදුසමය උපයෝගී කරගැනීම; (iii) අන්තර්පුද්ගල

සම්බන්ධතා පිළිබඳ ගැටලු; (iv) සමාජයීය ගැටලු - අවි ගැටුම්, ආර්ථික සහ පාරිසරික ගැටලු ද අන්තර්ගත අර්බුද; (v) සමාජ උපයුක්ත බුදුසමය සහ බුදුසමයේ සමාජයීය භාවිතය; බෞද්ධ භාවනා ක්‍රම

**කාලසීමාව** : දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** : දේශන සාකච්ඡා වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** : අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵලඃ** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව ගෝලීයකරණය වූ සමකාලීන ලෝකය විසින් මතුකරඇති අභියෝග පිළිබඳ අවබෝධයක් සහ එම අභියෝගවලට මුහුණදීම සඳහා වන බෞද්ධ ඉගැන්වීම්වල සහ ප්‍රතිපදාවල භාවිතය පිළිබඳ අවබෝධයක් විද්‍යාර්ථියාගෙන් අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්ඃ**


තිලකරත්න, අසංග, *මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය,* දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2008.

හෙට්ටිආරච්චි, ධර්මසේන, *බෞද්ධ සමාජවිද්‍යා ප්‍රවේශය*, කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ, 2001.

______________________ , *රාජ්‍ය පාලනයට බෞද්ධ උපදෙස්*, කොළඹඃ දයාවංශ ජයකොඩි සහ සමාගම, 2005.

## නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

## පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය

## බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව

**පාඨමාලාවේ විෂය ක්ෂේත්‍රය හා අරමුණ:**

බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ සෑම අංශයක් ම ආවරණය කෙරෙන මෙම ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව පහත සඳහන් අරමුණු සපුරාගනු පිණිස සැළසුම් කරඇත. (i) බෞද්ධ අධ්‍යයන විෂය පිළිබඳ අද්‍යතන සහ යාවත්කාලීන දැණුම විද්‍යාර්ථියාට ලබාදීම (ii) විෂය පිළිබඳ සාමාන්‍ය එහෙත් පරිපූර්ණ දැනුමක් විද්‍යාර්ථියාට ලබාදීම (iii) විවිධ බෞද්ධ සම්ප්‍රදායයන් පිළිබඳ සත්‍ය කරුණුවලින් යුත් වාස්තවික දැනුමක් ලබාදීම (iv) බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ තමන් ප්‍රියකරන අංශයක ගැඹුරු අධ්‍යයන සිදුකිරීමට සමත් අනාගත විද්වතුන් බිහිකිරීම; සහ මානව වර්ගයාගේ මෙම ශ්‍රේෂ්ඨ ආගමික හා දාර්ශනික උරුමයෙන් පෝෂණයවීම සඳහා දැඩි උනන්දුවක් දක්වන්නවුනට ඒ සඳහා ප්‍රවේශ මාර්ගයක් ලෙස ක්‍රියාකිරීම.

මෙම ක්ෂේත්‍රය තුළ ශාස්ත්‍රීය සහ වෘත්තිමය වශයෙන් සුදුසුකම් ලත් විද්වතුන් විසින් මෙම පාඨමාලාව සඳහා දේශන පවත්වනු ලැබේ.

**ප්‍රවේශය සඳහා සුදුසුකම්:**

i. කවර හෝ විෂයක් හදාරා පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් උපාධියක් ලබාතිබීම.

හෝ

ii. පිළිගත් විශ්වවිද්‍යාලයකින්/ආයතනයකින් බෞද්ධ අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබාතිබීම

iii. ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපාකාර සමාගමේ අවසාන පරීක්ෂණය සමත්ව තිබීම

iv. ඉහත සඳහන් සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨසභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් හෝ ලබාතිබීම.

**පාඨමාලා ව්‍යුහය:**

මෙම පාඨමාලාව පහත සඳහන් පාඨමාලා ඒකක හයෙන් සමන්විත වේ.

**MABS** 1115 **: බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය (ආදි බෞද්ධ, පශ්චාත් කාලීන ථෙරවාද, මහායාන සහ වජ්‍රයාන)**

**MABS** 1125 **:බුදුසමයේ මූලික ඉගැන්වීම්**

**MABS** 1135 **: බුදුසමයේ බුද්ධිමය ඉතිහාසයඃ ථෙරවාදය සහ චතුර්විධ බෞද්ධ සම්ප්‍රදාය**

**MABS** 1245 **:බෞද්ධ ඥානවිභාගය සහ ආචාරවිද්‍යාව (ආදි බෞද්ධ සූත්‍ර පදනම් කරගනිමින්)**

**MABS** 1255 **:බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය (ආදි බෞද්ධ සූත්‍ර පදනම් කරගනිමින්)**

**MABS** 1265 **:බෞද්ධ කලා හා ගෘහනිර්මාණය**

**MABS 1275: අපේක්ෂකයා විසින් තෝරාගන්නා ලද සහ පීඨාධිපතිතුමා විසින් අනුමත කරන ලද සුදුසු මාතෘකාවක් යටතේ, පර්යේෂණාත්මක අධ්‍යයනයක් පදනම් කරගත් වචන 5,000 කින් පමණ සමන්විත ස්වාධීන ශාස්ත්‍රීය නිබන්ධයක්**

**MABS** 1115 **: බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය , MABS** 1125 **: බුදුසමයේ මූලික ඉගැන්වීම්, MABS** 1135 **: බුදුසමයේ බුද්ධිමය ඉතිහාසයඃ ථෙරවාදය සහ චතුර්විධ බෞද්ධ සම්ප්‍රදාය සහ MABS 1275: ස්වාධීන ශාස්ත්‍රීය නිබන්ධය** යන පාඨමාලා ඒකක අනිවාර්ය වේ. අනිවාර්ය පාඨමාලා ඒකක ද සහිතව පාඨමාලා ඒකක 6 ක් සඳහා අපේක්ෂකයෙකු අවසාන පරීක්ෂණයට පෙනීසිට සමත්විය යුතුය.

**පාඨමාලාව සඳහා අවශ්‍යතා :** එක් එක් ඒකකයට අදාළ පැවරුමක් ද සහිතව විද්‍යාර්ථීන් විසින් යථොක්ත පාඨමාලා ඒකක හය සම්පූර්ණකිරීම අවශ්‍යය.

පාඨමාලා කාලය වර්ෂයක් වන අතර එක් පාඨමාලා ඒකකයක් දේශන පැය 30 කින් සමන්විත වේ.

**ඇගයීම් ක්‍රමයඃ**

| | |
|---|---|
| i. එක් පාඨමාලා ඒකකයකට අයත් පැවරුම සඳහා වන ලකුණු සංඛ්‍යාව | 30% |
| ii. පන්තිකාමර සහභාගීත්වය | 10% |
| iii. අවසාන පරීක්ෂණය | 60% |

**පාඨමාලා ඒකක නාමයඃ බෞද්ධ සාහිත්‍ය මූලාශ්‍රය (ආදි බෞද්ධ, පශ්චාත් කාලීන ථෙරවාද, මහායාන සහ වජ්‍රයාන)**

**පාඨමාලා ඒකක සංකේතයඃ MABS 1115**

**අරමුණඃ** ථෙරවාද, සම්භාව්‍ය ඉන්දීය මහායාන, නැගෙනහිර ආසියානු මහායාන සහ වජ්‍රයාන යන සියලු ම ප්‍රධාන බෞද්ධ සම්ප්‍රදායයන් පිළිබඳ පුළුල් දැනුමක් විද්‍යාර්ථීන්ට ලබාදීම සඳහා මෙම පාඨමාලා ඒකකය සැළසුම්කර ඇත.

**අන්තර්ගතයඃ** මෙම පාඨමාලා ඒකකය මගින් පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කෙරේඃ ආදි බෞද්ධ ධර්ම ග්‍රන්ථ සකස්වීම, ත්‍රිපිටකය; සූත්‍ර, විනය සහ අභිධර්ම පිටක; නෙත්තිප්පකරණ, පෙටකොපදෙස සහ මිලින්දපඤ්හ වැනි පශ්චාත් ත්‍රිපිටක කෘති; සර්වාස්තිවාද සහ සෞත්‍රාන්තික සාහිත්‍යය; පාලි අට්ඨකථා සහ ටීකා; ඉන්දීය සම්භාව්‍ය මහායාන නිකායයන්ගේ සාහිත්‍යය; මධ්‍යමක සහ යෝගාචාර; සංස්කෘත හා ටිබෙට් භාෂාවන්ගෙන් රචිත වජ්‍රයාන සාහිත්‍යය; සහ නැගෙනහිර ආසියානු (චීන) මහායාන සාහිත්‍යය.

**කාලයඃ** දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** ඃ දේශන, සාකච්ඡා, වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමයඃ** අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵලඃ** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව සමස්ත බෞද්ධ සම්ප්‍රදාය පිළිබඳ අවබෝධාත්මක දැක්මක් වර්ධනය කරගැනීමටත් බෞද්ධ සාහිත්‍යයේ අන්තර්ගතය සහ එහි ප්‍රධාන ලක්ෂණ සංක්ෂිප්ත වශයෙන් විස්තරකිරීමටත් විද්‍යාර්ථියා සමත්වනු ඇත.

නිර්දේශිත කියවීම්ඃ

අබේනායක, ඔලිවර්. (1983). *පාලි සාහිත්‍යය ඉතිහාසය.* 1. විනය පිටකය, කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

අදිකාරම්, ඊ. ඩබ්. (1969). *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය.* ජේ. කේ. පී. ජයවර්ධන සහ සමාගම.

තිලකරත්න, අසංග. (2001). *ශුන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය.* නුගේගොඩඃ තිමිර ප්‍රකාශන.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ, *පාලි සාහිත්‍යය.* (2007). මරදාන. රත්න පොත් ප්‍රකාශකයෝ.

Conze, E. (1998) *The Prajñāpāramitā Literature*, S. Gravenhage, Tokya: The Reiyakar.

Hinuber, Oskar von (2001). *Literature Handbook of Pali*. New Delhi: Munshiram Manoharlal.

Malalasekara, G. P. (1994). *The Pali Literature of Ceylon*. Kandy: Buddhist Publication Society.

Wader, A. K. *Indian Buddhism*. (2015). Motilal Banarsidass Publishers (P) Limited.

**පාඨමාලා ඒකක නාමයඃ බුදුසමයේ මූලික ඉගැන්වීම්**

**පාඨමාලා ඒකක සංකේතයඃ** MABS 1125

**අරමුණඃ** පාලි ත්‍රිපිටකයේ සූත්‍ර සහ අභිධර්ම පිටකවල විස්තර කෙරෙන බුදුසමයේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ ගැඹුරු දැනුමක් විද්‍යාර්ථියාට ලබාදීම අරමුණු කරගෙන මෙම පාඨමාලා ඒකකය සැළසුම් කරඇත.

**අන්තර්ගතයඃ** පහත සඳහන් ඉගැන්වීම් සාකච්ඡා කරනු ලැබේඃ පටිච්චසමුප්පාදය (බුදුරදුන්ගේ ඉගැන්වීම්වල දාර්ශනික පදනම වශයෙන්); ත්‍රිශික්ෂා සහ ආර්ය අෂ්ඨාංගික මාර්ගය අන්තර්ගත චතුරාර්ය සත්‍යය; ත්‍රිලක්ෂණය; සමථ සහ විපස්සනා භාවනා; සත්තිස් බෝධ්‍යංග ; පඤ්චස්කන්ධ; මනස පිළිබඳ සංකල්පය සහ කර්මය, සංසාරය සහ නිර්වාණය. දුකින් මිදීම කරා යොමුවූ ආචාරධර්මීය මාර්ගය නියෝජනය කරන්නක් ලෙස මෙම ඉගැන්වීම් අධ්‍යයනය කෙරේ.

**කාලයඃ**දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** ඃදේශන, සාකච්ඡා, වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** ඃ අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵලඃ** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරිමෙන් අනතුරුව බුදුසමයේ මූලික ඉගැන්වීම් විස්තර කිරීමේ හැකියාවට අතිරේකව බුරදුන්ගේ ඉගැන්වීම්වල පවතින අන්තර් සම්බන්ධතාව සහ අනුසන්ධානය විස්තරකිරීමට සමත්වනු ඇත.

**නිර්දේශිත කියවීම්ඃ**

තෝරාගත් සූත්‍රඃ ධම්මචක්කප්පවත්තන සූත්‍රය (සංයුත්තනිකාය - සච්චසංයුත්තය), සච්චවිභංග සූත්‍රය (මජ්ඣිමනිකාය), අනත්තලක්ඛණ සූත්‍රය ( සංයුත්තනිකාය), අලගද්දූපම සූත්‍රය (මජ්ඣිමනිකාය), ආනාපානසති සූත්‍රය (මජ්ඣිමනිකාය)

කරුණාරත්න, ඩබ්. එස්. (2011). බෞද්ධ දර්ශනය හා චරණය, කොළඹඃ සමයවර්ධන ප්‍රකාශන.

බුද්ධදත්ත හිමි, පොල්වත්තේ. (1962). ථෙරවාද බෞද්ධ දර්ශනය, කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

රාහුල හිමි, වල්පොල. බුදුන් වදාළ ධර්මය. (1993). කොළඹඃ සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

තිලකරත්න, අසංග. (2012). අභිධර්ම අධ්‍යයන. කොළඹඃ ගොඩගේ සහ සහෝදරයෝ.

Kalupahana, David J. (1976). *Buddhist Philosophy: Historical Analysis*, Honolulu: University of Hawaii Press.

----------- (1999). *The Buddhist Philosophy of Language*. Moratuwa, Sri Lanka: Vishvalekha Publications.

-------------- (1975). *Causality: the Central Philosophy of Buddhism*. Honolulu: University of Hawaii Press.

---------------- (1992). *A History of Buddhist Philosophy: Continuities and Discontinuities.* Honolulu: University of Hawaii Press.

Karunadasa, Y. (2015). *Early Buddhist Teachings. The Middle Position in Theory and Practice*. Kandy: Buddhist Publications society.

Wader, A. K. (2000). *Indian Buddhism*, (Chapters 4 and 5 in particular). New Delhi: Motilal Banarsidass.

Tilakaratne Asanga.(2012). *Theravada Buddhism: The View of the Elders*. Honolulu, University of Hawaii Press

**පාඨමාලා ඒකක නාමයඃ බුදුසමයේ බුද්ධිමය ඉතිහාසයඃ ථෙරවාදය සහ චතුර්විධ බෞද්ධ සම්ප්‍රදාය**

**පාඨමාලා ඒකක සංකේතයඃ** MABS 1135

**අරමුණඃ** ඉන්දීය බුදුසමයේ **ප්‍රධාන** ඉගැන්වීම්වල ඓතිහාසික පරිණාමය පිළිබඳ අවබෝධයක් විද්‍යාර්ථියාට ලබාදීම පිණිස මෙම පාඨමාලා ඒකකය සැළසුම් කරඇත.

**අන්තර්ගතයඃ** පහත සඳහන් තේමා ආවරණය කෙරේ. කථාවත්ථුව මගින් නියෝජනය කෙරෙන වාත්සිපුත්‍රීයන්ගේ පුද්ගලවාදය ඇතුළු ආදි බෞද්ධ නිකායන් සහ ඔවුන්ගේ මත; සෞත්‍රාන්තික මත ; වෛභාෂික මත ; ශූන්‍යතාව පිළිබඳ මාධ්‍යමික සංකල්පය සහ ආලය විඥානය සහ යථාර්ථය ඇතුළු සිත පිළිබඳ යෝගාචාර විග්‍රහය.

**කාලයඃ**දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** ඃදේශන, සාකච්ඡා, වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** ඃ අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ඉන්දීය බෞද්ධ සම්ප්‍රදාය තුළ වර්ධනය වූ ඇතැම් ප්‍රධාන ධර්මමය සංකල්පයන්ගේ ඓතිහාසික පරිණාමය පිළිබඳ උසස් දැනුමක් සහ අවබෝධයක් විද්‍යාර්ථියාගෙන් අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්:**


තෝමස්, ඊ. ජේ. (1966). *බෞද්ධ චින්තාවේ ඉතිහාසය.* පරි. කරුණා සේනානායක, දෙහිවල: බී. සී. සී. ප්‍රකාශන.

මේධානන්ද හිමි, දේවාලේගම. (1992). *චතුර්විධ බෞද්ධ දර්ශන සම්ප්‍රදාය හැඳින්වීමක්.* වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.

දත්, නලීනාක්ෂ . (2014). *ඉන්දියාවේ බෞද්ධ නිකායයන්.* පරි. පද්මා ගුණසේකර. නුගේගොඩ: සුනෙර ප්‍රකාශකයෝ.

Suzuki, D. T. (1983). *The Essence of Buddhism*. Kyoto: The Buddhist Society.

Robinson, R. H. (1967). *Early Madhyamaka in India and China*. Madison: University of Wisconsin.

Karunadasa,Y. (2015). *The Theravada Abhidhamma: It's Inquiry into the Nature of Conditioned reality.* (Chapter 17: pp. 245-274) Kandy: Budhist Publication Society.

Kalupahana, D. J. (1992). *A History of Buddhist Philosophy: Continuities and Discontinuities.* Honalulu: University of Hawaii Press.

-------------------- (1986). *Nagarjuna: The Philosophy of the Middle Way*. (Introduction pp. 1-98)

New York: State University of New York Press.

Wader, A. K. *Indian Buddhism*, (Chapters 9, 10, 11, and 12 in particular). New Delhi: Motilal Banarsidass.

Dhammajoti, K. L. (2015). *Sarvastivada Abhidhamma.* (pp. 63-160). Hong Kong: The Buddha Dharma Centre of Hong Kong.

**පාඨමාලා ඒකක නාමයඃ බෞද්ධ ඥානවිභාගය සහ ආචාරවිද්‍යාව (ආදි බෞද්ධ සූත්‍ර පදනම් කරගනිමින්)**

**පාඨමාලා ඒකක සංකේතයඃ** MABS 1245

**අරමුණඃ** බෞද්ධ ඥානවිභාගය පිළිබඳව සහ පාලි ත්‍රිපිටකාගත සූත්‍රදේශනාවන්හි විස්තර කෙරෙන සදාචාරාත්මක න්‍යාය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධාත්මක දැනුමක් විද්‍යාර්ථීයාට ලබාදීමේ අරමුණ ඇතිව මෙම පාඨමාලාව සැළසුම් කරඇත.

**අන්තර්ගතයඃ** දැනුම පිළිබඳ නිර්වචනය, ඥානමාර්ග, වෙනත් ඉන්දීය සම්ප්‍රදායන් විසින් පිළිගත් ඥානමාර්ග පිළිබඳ විචාර, දැනුම් වර්ග, ඒවායේ ස්වභාවය සහ සීමා. **ආචාරවිද්‍යාව** ඃ බුදුසමයේ අගැයුම්ශීලී ආචාරවිද්‍යාව සහ අධි-ආචාරවිද්‍යාව, බුදුසමයේ මූලික ආචාරවිද්‍යාත්මක සංකල්ප, පුණ්‍ය හා පාප සහ කුසල හා අකුසල, බුදුසමයේ ප්‍රායෝගික ආචාරධර්ම

**කාලයඃ**දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** ඃදේශන, සාකච්ඡා, වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** ඃ අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵලඃ** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව බුදුසමයේ ඥානය පිළිබඳ සංකල්පය සහ ආචාරවිද්‍යාත්මක න්‍යාය හා එහි භාවිතය පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් විද්‍යාර්ථීයා සතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නිර්දේශිත කියවීම්ඃ


ප්‍රේමසිරි, පී. ඩී. (1992). බෞද්ධ ආචාරධර්ම. බෞද්ධ විශ්වකෝෂ සිංහල ග්‍රන්ථමාලා අංක 1, කොළඹඃ බුද්ධ ශාසන අමාත්‍යාංශය.

තෝරාගත් පාලි සූත්‍රදේශනා (කාලාම සුත්ත, අංගුත්තරනිකාය, චංකි සුත්ත, මජ්ඣිමනිකාය ආදි.)

Jayatilake, K. N. (1980). *Early Buddhist Theory of Knowledge*. New Delhi: Motilal Banarsidas.

--------------------- (2010). *Facets of Buddhist thought*.( Chapters: 15-18 , The Basis of Buddhist Ethics, the Buddhist Concept of Evil, The Criteria of right and Wrong and The Ethical Theory of Buddhism) Kandy: Buddhist Publication Society.

Kalupahana, D. J. (1995). *Ethics in Early Buddhism*. ( pp. 63-160) Hawaii: University of Hawaii Press.

Keown, Damien (1992), *The Nature of Buddhist Ethics*. Hampshure: Pulgrave.

Misra, G.S.P. (1984). *Development of Buddhist Ethics*. New Delhi: Munshiram Manoharlal.

Tilakaratne, Asanga (2022). "Dependent Co-origination: The Buddhist Approach to Reality" in *Collected Papers of Asanga Tilakaratne*, Volume 1. Ed. Bertram G. Liyanage. pp. 31-40)

Wader, A. K. *Indian Buddhism*, (Chapter 11 in particular). New Delhi: Motilal Banarsidass.

**පාඨමාලා ඒකක නාමයඃ බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය (ආදි බෞද්ධ සූත්‍ර පදනම් කරගනිමින්)**

**පාඨමාලා ඒකක සංකේතයඃ** MABS 1255

**අරමුණ ඃ** පෞද්ගලික වශයෙන් මෙන්ම සාමාජයීය වශයෙන් ද ජනතාවගේ දෛනික ජීවිතය කෙරෙහි ඉමහත් බලපෑමක් සිදුකරන දේශපාලන හා ආර්ථික ගැටලු විසඳාගැනීමේ කාර්යයෙහි ලා බුදුරදුන්ගේ ඉගැන්වීම්වල අදාලත්වය පිළිබඳ අවබෝධයක් විද්‍යාර්ථීයාට ලබාදීම පිණිස මෙම පාඨමාලා ඒකකය සැළසුම් කර ඇත.

**අන්තර්ගතයඃ** බුදුසමයේ ආර්ථික හා දේශපාලන චිනස්තනය සාධාරණීකරනය කිරිම, බුදුසමයේ ආර්ථික හා දේශපාලන චින්තනයේ පදනම. **ආර්ථිකවිද්‍යාවඃ** ධනය නිෂ්පාදනය කළයුත්තේ සහ පරිභෝජනය කළයුත්තේ කෙසේද?; සම්මාකම්මන්ත හා සම්මාආජීවය ආර්ථිකවිද්‍යාත්මක දෘෂ්ටිකෝණයෙන් විමසාබැලිම, නිදහස් පුද්ගලවාදය සහ සමාජවාදය පිළිබඳ බෞද්ධ පර්යාවලෝකනය; **දේශපාලනයඃ** බුදුසමය හා සබැඳි පැරණි ඉන්දීය දේශපාලන පසුබිම, පැරණි ඉන්දීය දේශපාලන භාවිතය පිළිබඳ බෞද්ධ ප්‍රතිචාරය, බුදුරදුන්ට අනුව පරමාදර්ශී දේශපාලන නායකයා, පැරණි ඉන්දියාව, ශ්‍රී ලංකාව, දකුණු ආසියාව, ටිබෙටය සහ වෙනත් රටවල බෞද්ධ දේශපාලන චින්තනයේ ඓතිහාසික භාවිතය.

**කාලයඃ**දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** ඃදේශන, සාකච්ඡා, වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** ඃ අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵලඃ** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව ආර්ථිකය හා දේශපාලනය පිළිබඳ බෞද්ධ දැක්ම සම්බන්ධයෙන් පමණක් නොව බුදුරදුන්ගේ ඉගැන්වීම්වල සාමාජයීය අදාළත්වය පිළිබඳ පුළුල් අවබෝධයක් ද විද්‍යාර්ථීයා සතුවනු ඇතැයි අපේකෂා කෙරේ.

නිර්දේශිත කියවීම්ඃ

තෝරාගත් සූත්‍රඃ කූටදන්ත සූත්‍රය (දීඝනිකාය), චක්කවත්තිසීහනාද සූත්‍රය (දීඝනිකාය), (අංගුත්තරනිකාය).

තිලකරත්න, අසංග. (2025). මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

විජේබණ්ඩාර, චන්දිම සහ සනත් නානායක්කාර. (1995). බෞද්ධ ශිෂ්ටාචාරය හා ආර්ථික දර්ශනය. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

හෙට්ටිආරච්චි, ධර්මසේන. ( 2001). මුල් බුදුසමයෙන් හෙළිවන බෞද්ධ ආර්ථික දර්ශනය. බත්තරමුල්ල. අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

මුවර්, මැතිව් ජේ. බුදුසමය සහ දේශපාලන න්‍යාය. පරි. රළුවේ පද්මසිරි හිමි සහ ඩී. ඩී. සේනාධීර. කොළඹ: කොළඹ තරුණ බෞද්ධ සංගමය.

Karunatilake, H. N. S. (1976). *This Confused Society*. Colombo: Buddhist Information Centre.

Wader, A. K. *Indian Buddhism*, (Chapters 2 in particular). New Delhi: Motilal Banarsidass.

**පාඨමාලා ඒකක නාමය: බෞද්ධ කලා හා ගෘහනිර්මාණය**

**පාඨමාලා ඒකක සංකේතය:** MABS 1265

**අරමුණ:** මෙම පාඨමාලා ඒකකයේ අරමුණ වනුයේ කැටයම්, ප්‍රතිමා, චෛත්‍ය, චිත්‍ර සහ ගෘහනිර්මාණ වැනි බෞද්ධ කලා කෘතීන්ගේ විවිධ පැතිකඩ පිළිබඳව පුළුල් සාමාන්‍ය අවබෝධයක් විද්‍යාර්ථීන්ට ලබාදීමයි.

**අන්තර්ගතය:** පහත සඳහන් තේමා මෙහිදී ආවරණය කෙරේ. ඉන්දියාවේ, ශ්‍රී ලංකාවේ සහ බෞද්ධ ලෝකයෙහි බෞද්ධ ආරාමවල ඓතිහාසික විකාශය (සරළ වාසස්ථානවල සිට සංකීර්ණ ආරාම පද්ධති දක්වා) හැදෑරීම, බෞද්ධ ආරාමවල විවිධාංග : බුද්ධ ප්‍රතිමා සහ මුද්‍රා (දේහමය සන්නිවේදන ක්‍රම), චෛත්‍ය සහ ධාතු වන්දනාව, බෝධිඝර, වටදා ගේ සහ චිත්‍ර. බුදුසමයේ සෞන්දර්ය සංකල්පය පිළිබඳ සාකච්ඡාවකින් අධ්‍යයනය නිමකෙරේ.

**කාලය:**දේශන පැය 30

**ඉගැන්වීමේ ක්‍රම** :දේශන, සාකච්ඡා, වැඩමුළු සහ පැවරුම්

**ඇගයීම් ක්‍රමය** : අවසාන පරීක්ෂණය, පැවරුම් සහ පන්තිකාමර සහභාගීත්වය

**අපේක්ෂිත ඉගෙනුම් ඵල:** මෙම පාඨමාලා ඒකකය සම්පූර්ණකිරීමෙන් අනතුරුව බෞද්ධ සෞන්දර්යවේදය පිළිබඳ අවබෝධයක් හා ලෝක ව්‍යාප්ත බෞද්ධ සම්ප්‍රදාය තුළ දක්නට ඇති බෞද්ධ කලාකෘති පිළිබඳව සාමාන්‍ය දැනුමක් ද විද්‍යාර්ථීයා සතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**නිර්දේශිත කියවීම්:**

කුමාරස්වාමි, ආනන්ද කේ. (1962). *මධ්‍යකාලීන සිංහල කලා.* කොළඹ: සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

දේවේන්ද්‍ර, ඩී. ටී. (2015). *බුද්ධ ප්‍රතිමාව හා ලංකාව,* කොළඹ, එස් . ගොඩගේ සහ සහෝදරයෝ.

පරණවිතාන, එස්. ලංකාවේ ස්තූපය.

විජේසේකර, නන්දදේව (1993). (1993). *පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය*, කොළඹ: එම්. ඩී. ගුණසේන සහ සමාගම.

Bandaranayake, S. *Sinhalese Monastic Architecture*. Leiden: E. J. Brill.

Wickramagamage, Chandra, *Principles of Buddhist Iconology*. Polgasowita: Academy of Sri Lanka Culture.

Wijesekara, N. D. (1962). *Ancient Paintings and Sculptures of Sri Lanka*. Colombo: Department of Cultural Affairs.

# උසස් පර්යේෂණ උපාධි වැඩසටහන්

පහත සඳහන් උසස් පර්යේෂණ උපාධි වැඩසටහන් මෙම පීඨය මගින් මෙහෙයවනු ලැබේ.

(1) බෞද්ධ අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය

(2) බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශන විශාරද උපාධිය

## බෞද්ධ අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය

**ප්‍රවේශය සඳහා අවශ්‍ය සුදුසුකම් සහ යෝග්‍යතා:**

බෞද්ධ අධ්‍යයනය පිළිබඳ දර්ශනපති උපාධි වැඩසටහනට ප්‍රවේශවීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පහත සඳහන් සුදුසුකම්වලින් එකක් සපුරා තිබිය යුතුය.

i. පිළිගත් විශ්වවිද්‍යාලයකින් බෞද්ධ අධ්‍යයනය පිළිබඳව ශාස්ත්‍රපති උපාධියක් ලබාතිබීම

ii. බෞද්ධ අධ්‍යයනය හෝ එම විෂයක්ෂේත්‍රයට අයත් විෂයයක් හදාරා පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය ප්‍රථම පන්ති සාමාර්ථ්‍යයක් හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් ලබාතිබීම

iii. ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨසභාව සහ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

**අධ්‍යයන කාලය**

ප්‍රථම ලියාපදිංචි දින සිට පර්යේෂණාත්මක නිබන්ධය නිමකොට පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය වෙත භාරදෙන දිනය දක්වා වන අධ්‍යයන කාලය අවම වශයෙන් වසර දෙකක් ද උපරිම වශයෙන් වසර හතරක් ද වේ. විශේෂ හේතු පදනම් කොටගෙන සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ නිර්දේශය මත උපරිම කාලපරිච්ඡේදයෙන් ඔබ්බට තවත් වසරක් දක්වා අධ්‍යයන කාලය දිගු කළ හැකිය.

# බෞද්ධ අධ්‍යයන පිළිබඳ දර්ශන විශාරද උපාධිය

**ප්‍රවේශය සඳහා අවශ්‍ය සුදුසුකම්:**

බෞද්ධ අධ්‍යයනය හෝ ඊට අදාල විෂයකින් ලබාගත් දර්ශනපති උපාධියක්

හෝ

බෞද්ධ අධ්‍යයනය හෝ ඊට අදාල විෂයකින් ලබාගත් දෑ අවුරුදු ශාස්ත්‍රපති උපාධියක්

හෝ

ඉහත දැක්වෙන සුදුසුකම්වලට සමානයැයි ආයතනයේ පීඨසභාව සහ සනාතන සභාව විසින් පිළිගනු ලබන වෙනත් සුදුසුකමක් ලබා තිබීම

**අධ්‍යයන කාලය**

ප්‍රථම ලියාපදිංචි දින සිට පර්යේෂණාත්මක නිබන්ධය නිමකොට පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය වෙත භාරදෙන දිනය දක්වා වන අධ්‍යයන කාලය අවම වශයෙන් වසර තුනක් ද උපරිම වශයෙන් වසර හයක් ද වේ. විශේෂ හේතු පදනම් කොටගෙන සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ නිර්දේශය මත උපරිම කාලපරිච්ඡේදයෙන් ඔබ්බට තවත් වසරක් අධ්‍යයන කාලය දිගු කළ හැකිය.

**අයදුම්කිරීමේ සහ අධ්‍යයනයේ ක්‍රියාදාමය (පොදු)**

බෞද්ධ අධ්‍යයන පිළිබඳ දර්ශනපති උපාධිය සඳහා සහ දර්ශන විශාරද ලියාපදිංචිවීමට වර්ෂයේ කවර දිනයකදී වුවද අයදුම්පත් ඉදිරිපත් කළ හැකිය.

ඒ අනුව යථෝක්ත උසස් උපාධි වැඩසටහන්වලට ප්‍රවේශවීමට බලාපොරොත්තුවන අපේක්ෂකයෙකු නිර්දේශිත ආකෘතිපත්‍රයක නිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පතක් පශ්චාත්උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා වෙත ඉදිරිපත් කළයුතුය.

අපේක්ෂකයා විසින් යෝජිත පර්යේෂණ මාතෘකාව ද අයැදුම්පතෙහි සඳහන් කළයුතු වන අතර එම මාතෘකාව සම්බන්ධයෙන් පිළියෙළ කරන ලද වචන 200 කට නොවැඩි සංක්ෂිප්ත විස්තරයක් ද ඒ සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

යථොක්ත අයදුම්පත පීඨසභාව විසින් සළකා බලා පිළිගනු ලැබුවහොත් එදින සිට ලියාපදිංචිය වලංගුවන අතර ඒ බව අදාළ පර්යේෂණය සඳහා පත්කරනු ලබන අධීක්ෂකවරයා/වරු කවුරුන්ද යන්නත් සමග අපේක්ෂකයා වෙත දන්වනු ලැබේ.

ලියාපදිංචි දිනයේ සිට මාස තුනක් ඉකුත්ව යාමට පෙර අධීක්ෂකවරයාගේ උපදෙස් ද ලබාගෙන පහත සඳහන් අංග ද අන්තර්ගත කරමින් අපේක්ෂකයා විසින් විධිමත්ව පිළියෙල කරන ලද පර්යේෂණ යෝජනාව පශ්චාත්උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

i. උපාධි වැඩසටහනෙහි නාමය

ii. පර්යේෂණ මාතෘකාව

iii. පොදු හැඳින්වීම

iv. අරමුණු සහ පරමාර්ථ

v. පූර්ව අධ්‍යයන සමාලෝචනය

vi. පර්යේෂණ ගැටලුව

vii. ක්‍රමවේදය

viii. පර්යේෂණයෙහි සීමා

ix. පරිච්ඡේද ව්‍යුහය (තාවකාලික)

x. කාල රාමුව

xi. මූලික ග්‍රන්ථාවලිය

පර්යේෂණ මාතෘකාවෙහි හෝ පර්යේෂණ යෝජනාවෙහි කිසියම් සංශෝධනයක් අපේක්ෂා කරන්නේ නම් එම ඉල්ලීම නිබන්ධය ඉදිරිපත්කිරීමට නියමිත දිනට මාස හය (6) කට පෙර පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කළයුතුය.

පීඨ සභාවේ මෙන්ම සනාථන සභාවේ ද අනුමැතිය ලැබුණු විට දර්ශනපති/දර්ශන විශාරද පර්යේෂණ උපාධිය සඳහා මාස හයක් ඇතුලත ලියාපදිංචි වියහැකිය. ලියාපදිංචිය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

නියමිත දිනට පෙර සිය ලියාපදිංචිය යාවත්කාලීන කරගැනීමට අපේක්ෂකයෙකු අපොහොසත් වුවහොත් අදාළ අපේක්ෂකයා සිය කැමැත්තෙන් උපාධි වැඩසටහනෙන් ඉල්ලා අස්වූවා සේ සළකනු ලැබේ.

දර්ශනපති උපාධි අධ්‍යයන වැඩසටහන සඳහා ලියාපදිංචි වී සිටින විද්‍යාර්ථියෙකු විශිෂ්ඨ පර්යේෂණ කුසලතා ප්‍රදර්ශනය කරන්නේ නම් ස්වකීය අධ්‍යයන වැඩසටහන දර්ශන විශාරද උපාධි අධ්‍යයන වැඩසටහන දක්වා උත්තීර්ණ කරගැනීම සඳහා ඉල්ලීමක් කළහැකිය. කෙසේවෙතත් එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කළහැකි වනුයේ ලියාපදිංචි දිනයේ සිට මාස 12 සහ මාස 18 අතර කාලය තුළ දී වන අතර ඒ වන විට පර්යේෂණ කාර්යයෙන් ඔහු/ඇය 40% ක් සම්පූර්ණ කර තිබිය යුතුය. අදාළ ඉල්ලීම

අධීක්ෂකවරයා/වරුන්ගේ ද නිර්දේශ සහිතව පශ්චාත්උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. පීඨාධිපතිවරයා විසින් එය සළකා බලා සිය නිර්දේශය ද සහිතව පීඨ සභාව වෙත යොමුකෙරේ. කෙසේවෙතත් පීඨ සභාව විසින් මෙය සළකා බැලීමට පෙර අපේක්ෂකයා/අපේක්ෂිකාව තමන් විසින් ප්‍රදානය කිරීමට අපේක්ෂිත අතිරේක ශාස්ත්‍රීය දායකත්වය කුමක්ද යන්න පැහැදිලි කරමින් ද උත්තීරණ කිරීම සඳහා වන තම ඉල්ලීම සාධාරණීකරණය කරමින් ද ප්‍රස්තුතීකරණයක් ඉදිරිපත් කළයුතුය.

**උසස් උපාධි වැඩසටහනක් සම්පූර්ණකිරීම සඳහා වන අවශ්‍යතාඃ**

i. ආයතනය විසින් අනුමත කරන ලද මාතෘකාවක් අනුව අපේක්ෂකයා විසින් සිදුකරන ලද පර්යේෂණාත්මක අධයයනයක් පදනම් කරගෙන නිබන්ධයක් සම්පාදනය කිරීම

ii. පශ්චාත්උපාධි පීඨය විසින් නියම කරඇති පරිදි සාර්ථක ලෙස ප්‍රස්තුතීකරණ පවත්වා තිබීම

iii. ආයතනය විසින් පත්කරනු ලබන පරීක්ෂක මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වී ඉන් සමත්වීම

**දර්ශනපති සහ දර්ශන විශාරද අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රස්තුතීකරණ (Presentations)**

දර්ශනපති උපාධි අපේක්ෂකයින් ප්‍රස්තුතීකරණ තුනක් ඉදිරිපත් කළයුතුය.

i. ප්‍රථම ප්‍රස්තුතීකරණය පර්යේෂණ යෝජනාව පදනම් කරගනිමින් ලියාපදිංචි දින සිට මාස 03 ක් ඇතුලත සිදුකළ යුතුය. මෙහිදී අදාළ පර්යේෂණයේ සියලුම පැතිකඩ පිළිබඳ විස්තරයක් අපේක්ෂා නොකෙරෙන අතර පර්යේෂණ ගැටලුවේ ඇති වැදගත් කම සහ පර්යේෂණයේ අරමුණු පිළිබඳව පොදුවේ සංක්ෂිප්ත විස්තරයක් ඉදිරිපත්කිරීම ප්‍රමාණවත්ය.

ii. දෙවන ප්‍රස්තුතීකරණය ලියාපදිංචි දින සිට මාස 12 සිට 18 දක්වා වූ කාලය ඇතුලත සිදුකළ යුතුය. තමන් විසින් අනුගමනය කෙරෙන පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳව විග්‍රහයක යෙදෙමින් දත්ත රැස්කිරීම, විශ්ලේෂණය සහ පර්යේෂණයේ ඉදිරි ගමන්මගේ දිශානතිය පිළිබඳ පැහැදිලි විස්තරයක් මෙහිදී විද්‍යාර්ථියාගෙන් අපේක්ෂිතය. සිය දර්ශනපති උපාධි පර්යේෂණ වැඩසටහන දර්ශන විශාරද උපාධි වැඩසටහන දක්වා උසස් කරගැනීම පිණිස යථාපරිදි අයදුම්පත් ඉදිරිපත් කොට ඇති අපේක්ෂකයින් සිය ඉල්ලීම සාධාරණීකරණය කරමින් මෙම කාලසීමාව තුළ සිය ප්‍රස්තුතීකරණය ඉදිරිපත් කළයුතුය.

iii. තෙවැනි ප්‍රස්තුතීකරණය දෙවන වර්ෂය අවසානයේදී නිබන්ධය නිමකර ආයතනය වෙත භාරදීමට පෙර සිදුකළ යුතුය. පර්යේෂණයේ ප්‍රතිඵල පිළිබඳ විග්‍රයක යෙදෙමින් අදාල ක්ෂේත්‍රයෙහි ලා ශාස්ත්‍රීය ලෝකය වෙත ප්‍රදානය කෙරෙන ස්වීය දායකත්වය කුමක්ද යන්න පැහැදිලි කිරීම මෙහිදී විද්‍යාර්ථියාගෙන් අපේක්ෂිතය.

**දර්ශන විශාරද උපාධි අපේක්ෂකයින් විසින් පහත සඳහන් පරිදි ප්‍රස්තුතීකරණ තුනක් ඉදිරිපත් කළයුතුය.**

i. ලියාපදිංචි දින සිට මාස තුනක් ඇතුලත පර්යේෂණ යෝජනාව පදනම් කරගෙන පවත්වනු ලබන ප්‍රස්තුතීකරණය

ii. තමන් විසින් අනුගමනය කරනු ලබන පර්යේෂණ ක්‍රමවේද විස්තර කරමින් දත්ත රැස්කිරීම, දත්ත විශ්ලේෂණය පර්යේෂණයේ දිශානතිය පිළිබඳව පුළුල් විස්තරයක් ඉදිරිපත් කරමින් පවත්වනු ලබන ප්‍රස්තුතීකරණය

iii. ශාස්ත්‍රීය ලෝකය වෙත ඉදිරිපත් කෙරෙන ස්වීය දායකත්වය පැහැදිලි කරමින්, නිම කරන ලද නිබන්ධය ආයතනය වෙත භාරදීමට ප්‍රථම ලියාපදිංචිවූ දිනයේ සිට වර්ෂ තුනක් අවසානයේදී පවත්වනු ලබන ප්‍රස්තුතීකරණය

- ප්‍රස්තුතීකරණ ඉදිරිපත්කිරීමේදී බොහෝ ශිෂ්‍යයෝ පරිගණකය මගින් මුද්‍රණය කරන ලද දිගු ලිපිලේඛන ඇතැම්විට පැයකට ආසන්න කාලයක් කියවමින් සිටිති. එය අසාර්ථක සහ අසතුටුදායක පුරුද්දකි. ඒ වෙනුවට ප්‍රස්තුතිකරණයේ අන්තර්ගතය පිටු දෙකකින් හෝ තුනකින් යුතුව සංක්ෂිප්තව පරිගණකයේ මුද්‍රණය කොට එය ශ්‍රාවකයින්ට බෙදා දිය හැකිය. ලේඛනයක් කියවීමකින් තොරව කෙටි කාලයක් තුළ සිය අදහස කෙටි කාල පරිච්ඡේදයක් තුල විස්තර කිරීමට විද්‍යාර්ථියෙකු සමත්විය යුතුය.
- විද්වතුන් කණ්ඩායමක් සහ පර්යේෂණ ශිෂ්‍යයින් හමුවෙහි ප්‍රස්තුතීකරණය ඉදිරිපත් කළයුතුය. පර්යේෂණ නිපුණතාව සහ සන්නිවේදන කුසලතාව වර්ධනය කරගැනීමෙහි ලා එය ප්‍රයෝජනවත්ය.

**ප්‍රගති වාර්තාඃ**

අධීක්ෂකවරයගේ නිර්දේශය ද සහිතව විද්‍යාර්ථීන් විසින් සිය ප්‍රගති වාර්තා සෑම මාස හයකට වරක්ම පශ්චාත්උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කළයුතුය.

# නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

## මානෙල්වත්ත, බොල්ලෑගල, කැලණිය

## ශ්‍රී ලංකාව

### පශ්චාත් උපාධි අධ්‍යන පීඨය

**<u>පර්යේෂණාත්මක අධ්‍යයනයක් පදනම් කොටගෙන සිදුකෙරෙන නිබන්ධ සම්පාදනය සඳහා මාර්ගෝපදේශ</u>**

01. නිබන්ධයෙහි අන්තර්ගත වියයුතු අංග සහ ඒවායේ අනුක්‍රමිකත්වය පහත සඳහන් පරිදි වේ.

(අ) මාතෘතා පිටුව

(ආ) අපේක්ෂකයාගේ ප්‍රකාශය

(ඇ) අධීක්ෂකවරයා/වරුන් ගේ නිර්දේශ/ය

(ඈ) උපකාරානුස්මෘති (අවශ්‍යවන්නේ නම්)

(ඉ) සාරසංක්ෂේපය

(ඊ) පටුන

(උ) රූප සටහන් ලේඛනය (අවශ්‍යවන්නේ නම්)

(ඌ) සංක්ෂේපණ

(එ) ප්‍රධාන නිබන්ධය

(ඒ) ආශ්‍රිත ග්‍රන්ථාවලිය

(ඔ) උපග්‍රන්ථ (අවශ්‍යවන්නේ නම්)

**01. (අ) මාතෘකා පිටුව**

මාතෘකා පිටුව නිබන්ධයේ ප්‍රථම පිටුව සේ සැළකිය යුතුය. ආයතනයේ නම, නිබන්ධ මාතෘකාව, අපේක්ෂකයාගේ නම සහ ඔහුගේ/ඇයගේ ලියාපදිංචි අංකය, නිබන්ධයේ අරමුණ සහ එය ඉදිරිපත්කරන වර්ෂය හා මාසයද මාතෘකා පිටුවෙහි අන්තර්ගත විය යුතුය.

මාතෘකා පිටුවේ ආදර්ශයක් පහත දැක්වෙයි.

නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය

ශ්‍රී ලංකාව

නිබන්ධ මාතෘකාව

අපේක්ෂකයාගේ නම

(ලියාපදිංචි අංකය)

**නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ ශාස්ත්‍රපති/දර්ශනපති/දර්ශන විශාරද උපාධි අධ්‍යයන ඒකදේශීය අවශ්‍යතාවක් සම්පූර්ණ කරනු පිණිස ඉදිරිපත් කරනු ලබන නිබන්ධය**

**වර්ෂය හා මාසය**

**01. (ආ) අපේක්ෂකයාගේ ප්‍රකාශය**

අපේක්ෂකයාගේ ප්‍රකාශයෙහි ආදර්ශයක් පහත දක්වනු ලැබේ.

(නිබන්ධ මාතෘකාව) යන මාතෘකාව යටතේ වූ මෙම නිබන්ධය මවිසින් පවත්වන ලද පර්යේෂණාත්මක අධ්‍යයනයක ප්‍රතිඵලයක් බවත් මෙම අධ්‍යයනයේදී භාවිත කළ මූලාශ්‍රය පිළිබඳ විස්තර නිසිපරිදි නිබන්ධය තුළ දක්වා ඇති බවත් මෙම නිබන්ධය හෝ එහි කොටසක් හෝ මෙයට පෙර මවිසින් හෝ අන් අයෙකු විසින් කිසිදු විශ්වවිද්‍යාලයක් වෙත හෝ වෙනත් අධ්‍යයන ආයතනයක් වෙත කවරාකාරයෙන් හෝ ඉදිරිපත් කරන ලද්දක් නොවන බවත් සහතික කරමි.

අපේක්ෂකයාගේ අත්සන, නම සහ දිනය

**01. (ඇ) අධීක්ෂකවරයා/වරුන් ගේ නිර්දේශ/ය**

අධීක්ෂකවරයා/වරුන්ගේ නිර්දේශයේ ආදර්ශයක් පහත දක්වනු ලැබේ.

(නිබන්ධ මාතෘකාව) යන මාතෘකාව යටතේ වන මෙම නිබන්ධය නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනයේ අංක (ශිෂ්‍යයාගේ ලියාපදිංචි අංකය) යටතේ දර්ශනපති/දර්ශනවිභාරද උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචිවී සිටින (ශිෂ්‍යයාගේ නම) හිමියන්/මහතා/මහත්මිය/මෙනෙවිය මගේ අධීක්ෂණය යටතේ පවත්වන ලද පර්යේෂණාත්මක අධ්‍යයනයක් පදනම් කරගත්තක් වන බවටත් එය දර්ශනපති/දර්ශන විශාරද උපාධිය ප්‍රදානය කිරීම සඳහා සළකාබැලීම පිණිස යෝග්‍ය වන බවටත් නිර්දේශ කරමි/මු.

අධීක්ෂකවරයාගේ/වරුන්ගේ අත්සන සහ දිනය

**01. (ඈ) උපකාරානුස්මෘති** (අවශ්‍යවන්නේ නම්)

අධ්‍යයනය සාර්ථකව නිමකිරීම පිණිස උපකාරීවූ පුද්ගලයින්ට ස්තුතිය පිරිනැමීම පිණිස ඉතා සංක්ෂිප්ත සටහනක් මෙහි අන්තර්ගත කළ හැකිය.

**01. (ඉ) සාරසංක්ෂේපය**

පර්යේෂණයේ අරමුණ සහ එහි ප්‍රතිඵල සම්බන්ධයෙන් අවබෝධයක් පාඨකයාට ඉක්මණින් ලබාගැනීමට හැකිවන පරිදි සමස්ත නිබන්ධය පිළිබඳව වචන 300 කට නොවැඩි සාරාංශයක් මෙයින් අපේක්ෂිතය.

**01. (ඊ) පටුන**

ප්‍රධාන නිබන්ධයට පෙර හා පසුව ඇති බොහෝ අංග මාතෘකා පිටුවෙහි අන්තර්ගත වේ. පටුන යන්න පිටුවෙහි හරිමැද ඉහලින් සඳහන් විය යුතුවන අතර පිටු අංකවලට ඉහලින් 'පිටුව' යනුවෙන් සඳහන් කරනු නොලැබේ.

### 01. (උ) රූප සටහන් ලේඛනය (අවශ්‍යවන්නේ නම්)

නිබන්ධය තුළ රූප සටහන් හෝ ඡායාරූප හෝ අන්තර්ගත කරන්නේ නම් ඒ පිළිබඳ ලැයිස්තුවක් පටුනෙන් පසුව අන්තර්ගත කළ යුතුය.

### 01. (ඌ) සංක්ෂේපණ

ග්‍රන්ථ නාම නියෝජනය කිරීම සඳහා නිබන්ධය තුළ භාවිත කෙරෙන කෙටි යෙදුම් හෙවත් සංක්ෂේපණ සඳහා මෙම පිටුව වෙන්කළ යුතුය.

### 01. (එ) ප්‍රධාන නිබන්ධය

ප්‍රධාන නිබන්ධය ප්‍රමාණවත් පරිච්ඡේද සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය. ප්‍රථම පරිච්ඡේදය හැඳින්වීම වියයුතුය. පූර්ව අධ්‍යයන සමාලෝචනය, පර්යේෂණ යෝජනාව, අනුගමනය කළ ක්‍රමවේදය පිළිබඳ කෙටි විස්තරයක් සහ අධ්‍යයන ක්‍රමය ද හැඳින්වීමේ පරිච්ඡේදය තුළ සාකච්ඡා කිරීම යෝග්‍යය. පරිච්ඡේද අවසානයේදී නිගමනය අන්තර්ගත කළ යුතුය. එහෙත් එය පරිච්ඡේදයක් ලෙස සැළකිය යුතු නොවේ.

### 01. (ඒ) ආශ්‍රිත ග්‍රන්ථාවලිය

අධ්‍යයනයේදී තොරතුරු ලබාගැනීම පිණිස ඇසුරු කළ සියලු ම ලිඛිත මූලාශය ද මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ සිය දැණුම වර්ධනය කරගැනීම පිණිස උපකාරී වූ අනෙකුත් ග්‍රන්ථ ද ආශ්‍රිත ග්‍රන්ථාවලියෙහි අඩංගු වේ. මෙම ග්‍රන්ථාවලිය පිළියෙල කිරීමේදී ප්‍රාථමික මූලාශ්‍රය ප්‍රථමයෙන් සඳහන් කළයුතු වන අතර ද්විතීයික හා අනෙකුත් මූලාශ්‍රය විධිමත් පරිදි ඉන් අනතුරුව දැක්විය යුතුය.

### 01. (ඔ) උපග්‍රන්ථ (අවශ්‍යවන්නේ නම්)

උපග්‍රන්ථ ඇත්නම් ඒවා ආශ්‍රිත ග්‍රන්ථාවලියෙන් අනතුරුව අන්තර්ගත කළයුතු වන අතර එය ප්‍රධාන නිබන්ධයේ කොටසක් ලෙස සළකනු නොලැබේ.

**02.** දර්ශනපති උපාධි නිබන්ධයක් සඳහා නිර්දේශිත වචන සංඛ්‍යාව 50,000 සහ 60,000 අතර වන අතර දර්ශන විශාරද උපාධි නිබන්ධයක් සඳහා වන වචන සංඛ්‍යාව 70,000 සිට 90,000 දක්වා වේ. පාදක/අන්ත සටහන්, ආශ්‍රිත ග්‍රන්ථාවලිය සහ උපග්‍රන්ථ මේ සඳහා ගණන්ගනු නොලැබේ.

**03.** පීඨ සභාව විසින් අනුමත කරන ලද භාෂා මාධ්‍යයෙන් පරිගණකය භාවිතකොට නිබන්ධය මුද්‍රණය කළයුතුය. සිංහල මාධ්‍යය සඳහා FM අභය අක්ෂර මාලාව ද ඉංග්‍රීසි මාධ්‍යය සඳහා Times New Roman අක්ෂර මාලාව ද දැනට නිර්දේශ කෙරේ. නිබන්ධය මුද්‍රණය කිරීම සඳහා නිර්දේශිත අක්ෂරයේ ප්‍රමණය 12 වන අතර මාතෘකා ශීර්ෂ සඳහා 14 ප්‍රමාණයේ තද කළු අක්ෂර ද අනුමාතෘකා සඳහා 12 ප්‍රමාණයේ තද කළු පැහැ අක්ෂර ද යොදා ගතයුතුය. පේළි අතර පරතරය 1.5 ක් විය යුතුය. A/4 ප්‍රමාණයේ GSM 80 ඝනත්වයෙන් යුතු සුදු පැහැති කඩදාසිවල එක් පැත්තක පමණක් නිබන්ධය මුද්‍රණය කළ යුතුය. කඩදාසියේ වම් පස කෙළවරෙහි සෙ.මී. 4 ක ඉඩක් ද ඉහළ, පහළ සහ දකුණු කෙළවරවල සෙ.මී, 2.5 ක ඉඩක් ද තැබිය යුතුය.

**04.** පාලි, සංස්කෘත, ග්‍රීක, රෝම සහ ලතින් වැනි සම්භාව්‍ය භාෂා භාවිතයේදී උච්චාරණ සංකේත භාවිත කළ යුතුය. (මෙය බොහෝවිට අදාළ වනුයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් නිබන්ධය සම්පාදනය කිරීමේදීය).

**05.** ග්‍රන්ථ නාම සඳහා සහ පාලි, සංස්කෘත, ග්‍රීක, රෝම සහ ලතින් වැනි සම්භාව්‍ය භාෂා වලින් දැක්වෙන වචන හෝ ප්‍රකාශ සඳහා ඇල අකුරු (Italics) භාවිත කළයුතුය.

**06.** නිබන්ධය තුළ දීර්ඝ උධෘත අන්තර්ගත කරන්නේ නම් පිටුවේ දෙපස ප්‍රමාණවත් වැඩි අවකාශයක් තබා (Indent කොට) තනි පේළි පරතරයකින් යුතුව 11 ප්‍රමණයේ අක්ෂරවලින් මුද්‍රණය කළ යුතුවේ. පේළියකට හෝ දෙකකට සීමාවන කෙටි උධෘතයක් නම් ඒවා උධෘත කොමා තුළ යෙදීම ප්‍රමාණවත්ය.

**07.** අපේක්ෂකයාගේ මනාපය පරිදි පිළිගත් මූලාශ්‍රය දැක්වීමේ ක්‍රම අතුරින් එකක් තෝරාගත හැකිය. කෙසේ වෙතත් සමස්ත නිබන්ධය පුරා මූලාශ්‍රය දැක්වීමේ එක ම ශෛලියක් භාවිත කිරීමට අපේක්ෂකයා පරෙස්සම් විය යුතුය. පාදක සටහන් හෝ අන්ත සටහන් භාවිත කරන්නේ නම් එක් එක් පරිච්ඡේදය වෙනුවෙන් වෙන වෙනම අනුක්‍රමික ඛණ්ඩ උපයෝගී කරගත යුතුය.

**08.** මාතෘකා පිටුව නිබන්ධයේ ප්‍රථම පිටුව වේ. එහෙත් එහි පිටු අංකය සඳහන් නොකළ යුතුය. තව ද සෑම පරිච්ඡේදයක ම මුල්පිටුවේ එනම් එහි මාතෘකාව දැක්වෙන පිටුවේ පිටු අංකය සඳහන් නොකෙරේ. ප්‍රථම පිටුවේ සිට ප්‍රධාන නිබන්ධයේ ආරම්භය දක්වා පිටු අංක සඳහා රෝම ඉලක්කම් භාවිත කළයුතු වන අතර ප්‍රධාන නිබන්ධය ආරම්භයේ සිට නිබන්ධය අවසානය තෙක් පිටු අංක සඳහා ඉන්දු අරාබි ඉලක්කම් භාවිත කළ යුතුය. පිටු අංක දැක්වියයුතු වනුයේ පිටුවේ දකුණු පස ඉහළ කෙළවරෙහිය.

***සම්පාදක***

**ඩී. ඩී. සේනාධීර,** *PhD*

*විද්‍යාත්මක සහකාර*

***සම්බන්ධීකාරක***

**ගයනි කුමානායක**

*සහකාර ලේඛකාධිකාරී*

***ආයතනික තොරතුරු හා පරිගණක සැකසීම***

**ආර්. වී. වී. අයේෂා ලක්මාලි**

කළමනාකරණ සහකාර

# ආයතනයේ ගීතය

මහින්ද මාහිමි බුදුගොස් තෙරණුන්
වැඩි මග සළකුණු නෙතෙහි රුවා
මහාවිහාරය නාලන්දා වන්
සරසවි සිහිනය හිසින් දරා

තුන් සිංහලයේ සුරු විරු අබිමන්
ඉතිහාසය හද පතුලෙ හොවා
සිරිලක් මවගේ මෙත් සඳ කිරණින්
මුළුලොව සාමය දිලෙන තුරා

ධීර වීර අදිටන් බල යොදමින්
නාගානන්දයෙ සෙවණ අරා
එක් කුස හොත් සොහොයුරන් කැලක් මෙන්
ඥාණාලෝකයෙ පහන දරා

මානෙල්වත්තෙන් නාගානන් දෙන්
ලොවම එළිය වෙන දිනක් සොයා
උතුම් අටඟි මඟ පියවර තබමින්
ඇදෙමු ඉදිරියට රැය ද දිවා

පද රචනය : මහාචාර්ය සුමනපාල ගල්මංගොඩ

තනුව හා සංගීත නිර්මාණය : එම්. ඒ. පී. සමරසූරිය